## “ගමේ ඉතුරුම් - ප්‍රජාවගේ දිවිනැගුමට”

## අළුත් අවුරුදු උත්සවය හා ඉතුරුම් වැඩසටහන - 2014

**දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට අටවන එකතුව**

1. පාලක මණ්ඩලය,
   බැංකු සංගමය, ...............................
2. කළමනාකරු,
   බැංකු සංගමය, ...............................
3. සභාපති,විධායක කමිටුව,
   මහ සංගමය, .............................
4. කළමනාකාර අධ්‍යක්ෂ,
   මහ සංගමය, .........................................
5. මූලස්ථාන කළමනාකරු,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .........................................
6. ප්‍රාදේශිය ලේකම්,
   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, .......................................
7. දිස්ත්‍රික් සහකාර කොමසාරිස්,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
8. දිස්ත්‍රික්සම්බන්ධීකරණ නිලධාරි,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
9. දිස්ත්‍රික් ලේකම්,
   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ........................................
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,
11. සාමාන්‍යාධිකාරි සහ සියළුම අංශප්‍රධානීන්,
12. ලේකම්,
    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
    5 වන මහල,අංක 464, ටී.බී. ජායා මාවත,
    කොළඹ 10.

**බැංකු මූල්‍ය කටයුතු අංශය,දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව,**

**4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2014.03.11**

දුරකථන අංකය:- 0112 - 873798 ෆැක්ස් අංකය :- 0112 – 869494

**දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු මුල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරනු ලබන බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට අටවන එකතුව**

# "ගමේ ඉතුරුම් - ප්‍රජාවගේ දිවිනැගුමට"
# අළුත් අවුරුදු උත්සවය හා ඉතුරුම් වැඩසටහන - 2014

**1. හැදින්වීම.**

1.1 1995 වර්ෂයේ ආරම්භ කරන ලද සමෘද්ධි ව්‍යාපාරයේ මූලික අරමුණු වූයේ අඩුආදායම්ලාභී ජනතාව ඉතිරි කිරිම සඳහා පෙළඹවීම හා ස්වයංරැකියා අවස්ථා සඳහා ප්‍රාග්ධන පහසුකම් සමෘද්ධි බැංකුව හරහා ලබාදීමත්වේ. ඒ අනුව වසර 18 කට ආසන්න කාලයක් පුරා ඉතිරි කිරිම් ප්‍රවර්ධනය සඳහා හඳුන්වා දෙන ලද ප්‍රමුඛතම වැඩසටහන ලෙස අළුත් අවුරුදු ඉතුරුම් වැඩසටහන හඳුන්වාදිය හැකිය. අද එය සියළු ප්‍රජාවගේ ජීවන මාර්ග වැඩිදියුණු කරන දිවිනැගුම සංවර්ධන වැඩසටහන ලෙස පරිවර්තනය වී ඇත.

1.2 ඒ අනුව එකම දිනයක "ගමේ ඉතුරුම් - ප්‍රජාවගේ දිවිනැගුමට" යන තේමාව යටතේ "දහසක් අවුරුදු උත්සව" පැවැත්වීම මගින් එය ජාතික වශයෙන් දීප ව්‍යාප්තව ප්‍රජා සහභාගිත්වයෙන් පැවැත්වෙන දැවැන්තම සිංහල හා හින්දු අළුත් අවුරුදු සැණකෙලිය බවට පත්වී ඇත.

1.3 ඒ අනුව 2006 වර්ෂයේ රු.මිලියන 140 සිට 2013වර්ෂයන් තුල රු.මිලියන 1000 ට වැඩි මෙම ප්‍රවර්ධන වැඩසටහන ඉතා සාර්ථක ප්‍රගතියක් පෙන්වා ඇති බව ඔබගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, ස්ථාපිත වි ඇති හා සියළුම ප්‍රජා මුල බැංකු සංගම් ලාභදායි මට්ටම පත් වි ඇති අවස්ථාවක මෙම ඉතුරුම් වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීම සියළුදෙනාගේම වගකීම වේ.

| වර්ෂය | අනුමත තැන්පතු මුදල රු. මිලියන | අනෙකුත් තැන්පතු මුදල රු. මිලියන | මුළු තැන්පතු මුදල රු. මිලියන |
|---|---|---|---|
| 2006 | 53.5 | 86.5 | 140.0 |
| 2007 | 79.2 | 120.8 | 200.0 |
| 2008 | 127.0 | 145.0 | 272.0 |
| 2009 | 169.9 | 142.3 | 312.2 |
| 2010 | 308.1 | 202.6 | 510.7 |
| 2011 | 402.9 | 201.5 | 604.4 |
| 2012 | 624.9 | 265.7 | 890.6 |
| 2013 | 808.1 | 254.4 | 1062.5 |

1.4 ඒ අනුව ඉහත වගුව විශ්ලේෂණය කිරිමේදී අනුමත තැන්පතු ප්‍රමාණය මෙන්ම අනෙකුත් තැන්පතු මුදල්වලද වර්ධනයක් පෙන්නුම් කර ඇත. එසේම බැංකු සංගම් සඳහා වඩාත් වාසිදායක දිගු කාලීන තැන්පතු සඳහා වඩාත් දිරිගන්වන වර්ධනයක් ඇති කර ගැනීමට බැංකු සංගම් සමත් වී ඇති බව ද පෙනීයයි. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ සමස්ථ කාර්ය මණ්ඩලයේ හා ප්‍රජාවගේ ආයෝමය ශක්තිය හා ඔවුන්ගේ අති විශිෂ්ය කැපවීමයි. මේ නිසා අපගේ කාර්ය මණ්ඩලය හා සහභාගි වූ සැමට ගෞරවණීය ප්‍රශංසාව මෙමගින් පළ කර සිටිමු.

1.5 ඒ අනුව 2013 වසරේ බැංකු සංගම් 1074 අතුරින් රු. 1,500,000/ ක අනුමත තැන්පතු සීමාව ඉක්ම වූ බැංකු සංගම් ගණන 117 ක් වන අතර 2012 වසරේ බැංකු සංගම් ගණන 64 කි. එමෙන්ම මෙම බැංකු සංගම් අතර රු. 5,000,000/- ක සීමාව ඉක්ම වූ බැංකු සංගම් ද දක්නට ලැබීම සතුටට කරුණක් වේ. ඒ අනුව එම බැංකු සංගම් පිළිබඳව ඔබගේ දැනගැනීම සඳහා යොමු කරමි.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | බැංකු සංගමය | අනුමත තැන්පතු මුදල රු. |
|---|---|---|
| කිරාන් | සන්දිවේලයි | 6,190,600/- |
| වාලච්චේනෙයි | වාලච්චේනෙයි | 5,796,490/- |
| සියඹලාණ්ඩුව | ඇතිමලේ | 5,590,181/- |
| හික්කඩුව | බූස්ස | 4,672,750/- |
| හික්කඩුව | ඌරවත්ත | 3,755,655/- |

ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ බැංකු මුල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 හා එහි එකතුන් හි සඳහන් කරුණු පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව මෙම වසරේද ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරනු ලැබේ.

**2. තේමාව,**

“ගමේ ඉතුරුම් ප්‍රජාවගේ දිවිනැගුමට ” යන්න වේ.

**3. අළුත් අවුරුදු ගණුදෙනු සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගමය විවෘත කිරිම.**

3.1 මෙවර අළුත් අවුරුදු ගණුදෙනු කිරිම යෙදි ඇත්තේ අප්‍රේල් මස 14 සඳුදා දින පූර්ව භාග 11.05 ට බැවින් අළුත් අවුරුදු ගණුදෙනු සඳහා බැංකු සංගමය අප්‍රේල් මස 14 දින පෙ.ව.11.00 ටපෙර විවෘත කළ යුතුවේ.

3.2 අවුරුදු ගණුදෙනු සඳහා බැංකු සංගමය වෙත පැමිණෙන ගණුදෙනුකරුවන් වෙත සුදුසු තිළිණයක් බැංකු සංගමයේ වියදමින් ලබාදීමට අවසර දෙනු ලැබේ. එම තිළිණ ලබාදිමේදී විශේෂයෙන් බැංකු සංගමයට අවාසිදායක නොවන පරිදි අනුමත තැන්පතු මුදලට සාපේක්ෂව තිළිණ ලබාදීමට කටයුතු කළ යුතුවේ.

3.3 තිළිණ ලබාදීමේදි පහත දැක්වෙන සීමාවන් තුල කටයුතු කිරිමට වග බලාගත යුතු වේ. වැය කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා වැඩසටහනට කලින් විශේෂ අනුමැතියක් ලබා ගත යුතුය.

**සැ.යුතුය :-**

මෙම කාලවකවානුව තුළ තැන්පත් කරනු ලබන අනුමත තැන්පතු මුදල අවම වශයෙන් වසරක කාලයක් ගිණුම් තුල පවත්වාගෙන යා යුතුවේ.

තිළිණ ලබාදීම සඳහා පහත සඳහන් සීමාව තුල රු. 100 සිට රු. 1000 ක අනුමත තැන්පතුවක් සඳහා රු. 10/- ක කාසියක් ද ලබාදෙන ලෙස දන්වා සිටිමි. වසරකට නොඅඩු අනුමත තැන්පත් මුදලින් 5% ක් නොඉක්මවන මුදලක් මෙම ත්‍යාග ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකිය.

3.4 අළුත් අවුරුදු ගණුදෙනු වෙනුවෙන් බැංකු සංගමය විවෘත කරනු ලබන 2014.04.14 දින හා ඉතුරුම් සතියේ දින 07 ටම සහභාගි වන බැංකු කාර්ය මණ්ඩලයට හා කේෂ්ත්‍ර නිලධාරින් සඳහා දින 02 ක නිවාඩු දින වැටුප් බැංකු සංගමයේ වියදමින් දැරීමට අවසර දෙනු ලැබේ. මෙම විශේෂ වැටුප ලබාගැනීමට කේෂ්ත්‍ර නිලධාරින් විසින් අළුත් අවුරුදු ගණුදෙනු කාලසීමාව තුල අනුමත තැන්පතු සඳහා අවම වශයෙන් රු. 50,000/- ක මුදලක් එකතු කළ යුතුය, යන කොන්දේසියට යටත්ව මෙම ගෙවීම් කිරිමට අවසරය දෙනු ලැබේ.(බැංකු සංගමය වෙත ලබා දී ඇති අනෙකුත් දින වැටුප් වලට අමතරව, මෙම දින 02 කවැටුප හිමි වේ.)

මේ සම්බන්ධ අදාල ගිණුම් සටහන් ලබාදී ඇති උපදෙස් පරිදි පොදු ලෙජරයේ සටහන් තබන ලෙස දන්වමි.

**4. ඉතුරුම් ප්‍රවර්ධන සතිය - (2014.04.14- 20 දින දක්වා)**

මේ පිළිබඳව බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි 17 හා 18 ට පස්වන එකතුවට අනුව කටයුතු කළ යුතුවේ.

**5. දිවිනැගුම අළුත් අවුරුදු උත්සව**

5.1 ජාතික වශයෙන් ඉතාමත් වැදගත් වන මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුත්තේ 2014 අප්‍රේල් 20 වන ඉරිදා දින අතර සුදුසු පරිදි තම කලාපය තුල එක් අවුරුදු උත්සවයක් පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. එහෙත් විශේෂිතම හේතුවක් මත එම දිනයේ දී පැවැත්වීමට නොහැකි නම් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත අප්‍රේල් 20 වන දිනට පසු දිනෙකපැවැත්විය හැකිය. ඒ පිළිබඳව බැංකු මූල්‍ය කටයුතු අංශයේ අනුමැතිය ලබා ගත යුතුය. නිසි අනුමැතිය නොගෙන පවත්වන කිසිදු බැංකු සංගමයකට බැංකු මූල්‍ය කටයුතු අංශයෙන් ප්‍රතිපූර්ණ පදනම මත ලබාදෙන රු.15,000/- ක මුදල ලබානොදෙන බව කාරුණිකව දන්වමි. ඊට අමතරව බැංකු සංගමයේ වියදමින් රු. 25,000/- ක මුදලක් වැය කළ හැකිය. බැංකු මූල්‍ය කටයුතු අංශය විසින්මෙම මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබන්නේ රු. 500,000/- කට

වඩා අනුමත තැන්පතු රැස්කරන බැංකු සංගම් සඳහා පමණක් වන අතර එම මුදල් සීමාව ඉක්මවීමට අපොහොසත් වන බැංකු සංගම් එම වියදම තම බැංකු සංගමයේ වියදමක් ලෙස දරා ගත යුතුය. ජාතික ජාත්‍යන්තර වශයෙන් වැදගත් බැවින් මෙම අළුත් අවුරුදු උත්සව සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමා ප්‍රමුඛ දේශපාලන අධිකාරිය, ආගමික නායකයින්, රජයේ නිලධාරින් හා සියළුම ප්‍රජා නායකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීමට අවශ්‍ය ආරාධනාවන් කළ යුතුය.

**සැ.යුතුය ;-**

මේ පිළිබඳ ප්‍රගතිය ඇමුණුම් අංකII හා IIIපරිදි මහා සංගමයට ලබාදී මහ සංගමය විසින් නිවැරදි ලෙස පිළියෙල කර 2013.05.09 දිනට පෙර නොඑවන කිසිදු බැංකු සංගමයක් සඳහා ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

ඊට අමතරව 5.2, 5.3 බැංකු සංගම් මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට පස්වන එකතුවට අනුව කටයුතු කළ යුතුය.

## 6. ප්‍රචාරණය.

6.1 දිවිනැගුම අළුත් අවුරුදු උත්සවයට අදාල බැනරයක් බැංකු සංගමයේ වියදමින් සකසා ගැනීමට අවශ්‍ය බලය මින් ලබාදෙනු ලැබේ. ඒ අනුව පසුගිය වසරවලදි අප විසින් ලබාදුන් බැනරයේ ප්‍රමාණයට විචිත්‍රවත් බැනරයක් වන ලෙස සකස් කරගෙන බැංකු පරිශ්‍රය ඉදිරිපිට කල්වේලා ඇතිව ප්‍රදර්ශනය කළ යුතුවේ. මේ සඳහා බැංකු සංගමයකට රු. 1500/- ක උපරිමය සීමාවක් යටතේ සුදුසු මුදලක් වැය ගිණුම - උත්සව කටයුතු ගිණුම (කේත අංක 2133) හර කර ලබාගත හැකිය.

6.2 අපගේ මාධ්‍ය අංශයේ සහයෝගයෙන් අළුත් අවුරුදු වැඩසටහන අදාල ගුවන්විදුලිය සහ රූපවාහිනිය වැනි ජනමාධ්‍ය සම්බන්ධ කරගනිමින් ද පුළුල් ප්‍රචාරණයක් ලබාදීමට කටයුතු කෙරේ.

## 7. කාර්ය මණ්ඩලය ඇගයීම.

පසුගිය වසරවලදී ලැබූ අත්දැකිම් හා මේ පිළිබදව ලැබී ඇති යෝජනා හා අදහස් සලකා බැලිමෙන් අනතුරුව පහත සඳහන් ඇගයීමේ ක්‍රමවේදයක් මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරිමට අදහස් කරනු ලැබේ.

### 7.1 ජාතික මට්ටමේ ඇගයීම.

මේ සඳහා ඇගයීම් ක්‍රමයක් සකස් කර ඇගයීම සිදු කරනු ඇත.

**<u>සැලකිය යුතුය :-</u>**

මෙයට අදාල තොරතුරු ඇමුණුම් **iv** ට අනුව නිවැරදිව පිළියෙල කර මහ සංගම් කළමනාකාර අධ්‍යක්ෂ විසින් 2014.05.09 දිනට පෙර එවිය යුතුය. එසේ නොවන කිසිදු බැංකු සංගමයක් සඳහා ප්‍රශංසා ලිපි නිකුත් නොකරන බවත්, අදාල තොරතුරු බැංකු මූලා කටයුතු අංශයට ලැබුනේද යන්න විමසා බැලීම බැංකු කළමනාකරුගේ හා දිස්ත්‍රික් විෂය භාර කළමනාකරුගේ වගකීමක් ද වේ. (නිලධාරීන්ගේ නමේ මුල් අක්ෂර ඉංග්‍රිසි හෝඩියේ අක්ෂර වලින් එවිය යුතුය.)

අනුමත තැන්පතු මුදල රු. 2500,000/- වැඩි තැන්පතු එක් රැස් කරනු ලබන බැංකු සංගමයඇගයීමට ලක්කරනු ලැබේ.

අනුමත තැන්පතු සඳහා කේෂ්ත්‍රයෙන් පමණක් රු. 250,000/- හෝ ඊට වැඩි තැන්පතු රැස් කළ සමෘද්ධි නිලධාරින් ඇගයීමට අදාල තොරතුරු ද මහ සංගම් මට්ටමින් එවීම සඳහා ඇමුණුම iv ආකෘතිය භාවිතා කරන්න.

**7.2 දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම.**

මෙම ඇගයීම් ලිපි නිකුත් කිරිම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සහකාර කොමාසරිස්වරුන්ගේ අත්සනින් යුතුව සිදු කළ යුතුය.

අනුමත තැන්පතු සඳහා රු. ලක්ෂ15 - 25 අතර බැංකු සංගම්හි කළමනාකරු, කාර්ය මණ්ඩලය හා කේෂ්ත්‍ර කාර්ය මණ්ඩලය නමින් මෙම ඇගයීම් ලිපි නිකුත් කළ යුතුය. අනුමත තැන්පතු සඳහා රු.50,000/- ට වඩා අඩුවෙන් මුදල් රැස්කරණ ක්ෂේත්‍ර නිලධාරීන් මෙම ඇගයීමට දායක කර නොගත යුතුය.

මේ සඳහා අවශ්‍ය තොරතුරු බැංකු සංගම් මට්ටමින් ලබාගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සුදුසු වගුවක් මගින් යොමු කිරිමේ පූර්ණ වගකීම කළමනාකාර අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, අදාල

සහතික පත්‍ර සකස් කර නිලධාරින් වෙත ප්‍රදානය කිරිමේ වගකිම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැංකු විෂයභාර කළමනාකරු වෙත පැවරේ.

**7.3 මහ සංගම් මට්ටමේ ඇගයීම.**

අනුමත තැන්පතු සඳහා රු.500,000 - 1,500,000 ත් අතර බැංකු සංගම් හී කළමනාකරු හා කාර්ය මණ්ඩලය හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය නමින් මෙම ඇගයීම් ලිපි නිකුත් කළ යුතුයි. අනුමත තැන්පතු සඳහා රු.50,000 ට වඩා අඩුවෙන් මුදල් රැස් කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් මෙම ඇගයීමට දායක කරගත නොගත යුතුය.

7.4 අළුත් අවුරුදු ගණුදෙනු ඉතුරුම් වැඩසටහන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ප්‍රජාමූල බැංකු සංගම්වල නිලධාරීන්ගේ සහභාගිත්ව සංවර්ධන වැඩසටහනක් වන බැවින් සියළු ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහභාගිත්වය අපේක්ෂා කෙරේ.

7.5 තැන්පතු ඒකරාශී කිරීමේ දී ප්‍රතිලාභීන්ගේ සහනාධාර මුදල ගිණුම් වලින් ඉවත් කර අළුත් අවුරුදු තැන්පත් වලට ගැනීම බලවත් වරදක් වන බව දන්වා සිටීමට කැමත්තෙමි.

## 8. පොදු කරුණු

8.1 විවිධ හේතු මත 2013 වර්ෂයේ අළුත් අවුරුදු වියදම් යම් බැංකු සංගමයක් ප්‍රතිපූර්ණය නොකර තිබේ නම්, ලබාදී ඇති උපදෙස් පරිදි එය 2014 වර්ෂ අවසාන ලාභ අලාභ ගිණුමට වහාම ගැලපිය යුතුය.

8.2 අදාල පොදු ලෙජර් ගිණුම් සටහන් පැනවීමේදි පසුගිය චක්‍රලේඛ ලිපියේ හා අනිකුත් චක්‍රලේඛ මගින් ලබාදී ඇති උපදෙස් පරිදි කටයුතු කරන්න.

8.3 මේ පිළිබඳව යම් විමසිමක් සිදු කරන්නේ නම් 0112-887372 හා 0113-106382 මගින් ඉතුරුම් ප්‍රවර්ධන අංශයේ සමෘද්ධි කළමනාකරු උදය කුමාර සොයිසා මහතා අමතන්න.

**9.** **ප්‍රගතිය වාර්තා කිරිම.**

9.1 සහකාර සමෘද්ධි කොමසාරිස්ගේ/ නියෝජ්‍ය දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ විශේෂ අවධානයට.

අළුත් අවුරුදු ගණුදෙනු ප්‍රගතිය සම්බන්ධව ගරු ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමාගේ දැඩි අවධානය යොමුව ඇති බැවින්, එහි ප්‍රගතිය කඩිනමින් ඉදිරිපත් කළ යුතුව ඇත. එම නිසා ඔබ කාර්යාලයේ බැංකු විෂයභාර කළමනාකරුගේ සහයෝගයෙන් සියළුම මහ සංගම් හා සම්බන්ධිකරණය වෙමින් පහත සදහන් ආකෘතියට අනුව වඩාත් නිවැරදිව සැකසූ වාර්තාවක් 2014.04.30 දිනට පෙර අප වෙත එවිය යුතුවේ. එම එවන වාර්තාව මහ සංගම් විසින් අප වෙත එවන තොරතුරු හා සංසදනය කිරිමේදි වැරදි බැවින් නිවැරදිව පිළියෙල කර එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

**ඇමුණුම්I**

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය/ මහ සංගමයේ නම<br>1 | පැවැත් වූ අවුරුදු උත්සව ගණන<br>2 | 2014.04.14දින සිට 2014.04.20 දින දක්වා අනුමත තැන්පතු සදහා එකතුන් කළ මුදල<br>3 | 2014.04.14 දින සිට 2014.04.20 දින දක්වා අනුමත නොවන තැන්පතු සහ එකතු කළ මුදල<br>4 | මුළු තැන්පතු මුදල<br>3+4 |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

**9.2** **මහ සංගම් කළමනාකාර අධ්‍යක්ෂගේ විශේෂ අවධානයට.**

ප්‍රගතිය හා තොරතුරු වාර්තා කිරිමේ හා එහි නිරවද්‍යභාවය පිළිබඳ පූර්ණ වගකීමක් ඔබ වෙත පැවරී ඇත. ඒ අනුව ඉහත ඡේද 7.1 හි සඳහන් කාර්ය මණ්ඩලය ඇගයීම සම්බන්ධ තොරතුරු චක්‍රලේඛ ලිපි අංක 17 හා 18 ට හයවන එකතුවේ සඳහන් උපදෙස් පරිදි බැංකු මූල්‍ය කටයුතු අංශය හා අදාල අංශ වෙත පහත සඳහන් ඇමුණුම් හි සඳහන් තොරතුරු සමග 2014.05.09 දිනට පෙර බැංකු මූල්‍ය කටයුතු අංශය වෙත එවන මෙන් දන්වා සිටිමු. වෙනත් අංශ වෙත යැවිය යුතු තොරතුරු ද එම දිනයට පෙර යැවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

**<u>සැලකිය යුතුය.</u>**

මෙම දිනට තොරතුරු අප වෙත එවීමට කටයුතු නොකරන කිසිම මහ සංගමයකට අදාල වියදම් ප්‍රතිපූර්ණය නොකරන අතර ප්‍රශංසා ලිපි නිකුත් නොකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. එම බැංකු සංගම්වලට අදාල වියදම් හා වගකීම් මහ සංගමය විසින් දැරිය යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි. මෙම තොරතුරු අප වෙත 0112869494 ට ෆැක්ස් කරන ලෙසත් එම තොරතුරු ලියාපදිංචි තැපැලෙන් අප වෙත එවන ලෙසත් දන්වා සිටිමි.

9.2.1 පහත සඳහන් ඇමුණුම් හී ඒ ඒ තැන්පතු සඳහා බැංකු සංගමය හා ක්ෂේත්‍ර නිලධාරින් රැස් කල මුළු මුදලම දැක්විය යුතුය.

අවුරුදු ගනුදෙනු සිදු කරන කාල වකවානුවේදී අතරැදි මුදල් සංරක්ෂණ සීමාව පිළිබඳව ද අවධානය යොමු කර මුදල් ලැබීම් කළමනාකරණය කරගත යුතු බව ද අවධාරණය කරමු. එය දිනක් වෙනුවෙන් සංරක්ෂණ සීමාව වැඩි කිරිම සඳහා ගියවර ඉල්ලීම් ඉදිරිපත් කර තිබු අතර එසේ එක් දිනයක් සඳහා වැඩිකර දිය නොහැකිය.

| | | |
|---|---|---|
| ආර්.පී.බී. තිලකසිරි, | සී.ඩී.කළුආරච්චි, | කේ.කේ.එල්. චන්ද්‍රතිලක, |
| අධ්‍යක්ෂ ජනරාල්. | සාමාන්‍යාධිකාරී. | නි.අධ්‍යක්ෂ - බැංකු මූල්‍ය කටයුතු හා මහ සංගම්. |

ඇමුණුම් **II**

| | දිස්ත්‍රික්කය :............................................. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය :-............................................. | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බැංකු සංගමය | කොටස් **1** | ළමා **2** | සිසුරක **3** | සමූහ **4** | එකතුව **1+2+3+4** | සාමාජික **5** | සාමා. නොව **6** | දිරිය මාතා **7** | එකතුව **5+6+7** | මුළු එකතුව **1+2+3+4+5+6+7** | මුළු එකතුවට සමාන විය යුතුය | |
| | | | | | | | | | | | ක්ෂේත්‍ර ලැබීම් එකතුව | ප්‍ර. කාර්යාලීය ලැබීම් එකතුව |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

අවුරුදු උත්සවය පිළිබඳ තොරතුරු

ඇමුණුම් **III**

| **දිස්ත්‍රික්කය :- ..............................** **ප්‍රා.ලේ.කාර්යාලය : ..............................** **මහ සංගමය :-............................** | | | | | |
|---|---|---|---|---|---|
| බැංකු සංගමය | අවුරුදු උත්සවය පැවැත් වූ දිනය | අවුරුදු උත්සවය පැවැත් වූ ස්ථානය | වියදම් සඳහා ඒකරාශි කරගත් මුදල | | එකතුව |
| | | | අනුමත ප්‍රතිපූර්ණ රු | අනුමත බැංකු | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඇමුණුම් **IV**

රු.**1,500,000** ක් හෝ ඊට වැඩි අනුමත තැන්පතු රැස්කළ බැංකු සංගම් තොරතුරු**.**

දිස්ත්‍රික්කය :- **...................................**

| මහ සංගමය | බැංකු සංගමය | අනුමත තැන්පතු සඳහා බැංකු සංගමය වෙත පැමිණ තැන්පත් කළ මුදල (කොටස්+ළමා+සිසුරක+සමූහ) | අනුමත තැන්පතු සඳහා ක්ෂේත්‍රයෙන් පමණක් එකතු කළ මුදල (මෙහිදී බැංකු සංගමයේ නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නම හා තනතුර හා එකතු කළ මුදල දක්වන්න) | |
|---|---|---|---|---|
| | | | නිලධාරියාගේ නම | එකතු කළ මුදල |
| | | | | |
| | | | | |